# කොළඹ විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකාව
# නීති පීඨය
# නීතිවේදී උපාධි පරීක්ෂණය - මාර්ගගත, 2020/2021

## <u>මාර්ගගත විභාගය සඳහා ශිෂ්‍ය ප්‍රකාශය</u>

| | | | | | |
|---|---|---|---|---|---|
| **1.** | **ශිෂ්‍ය/ශිෂ්‍යාවගේ නම:** | | | | |
| **2.** | **ලියාපදිංචි අංකය:** | | | | |
| **3.** | **අධ්‍යයන වසර:** | I වසර | II වසර | III වසර | Iv වසර |

### <u>සාමාන්‍ය ප්‍රකාශය</u>

මාර්ගගත විභාගය සහ එහි ප්‍රතිඵල සම්බන්ධයෙන් විශ්ව විද්‍යාලයේ තීරණයට විරෝධය දැක්වීමකින් හෝ විරෝධතාවයකින් තොරව ඉදිරිපත් කිරීමට මම මෙයින් කටයුතු කරමි. පහත ලැයිස්තුගත උපදෙස් මම තදින් අනුගමනය කරමි:

1) දිනය, ආරම්භක හා අවසන් වේලාව ඇතුළුව කාලසටහන අනුගමනය කරන ලෙස සිසුන්ගෙන් ඉල්ලා සිටියි;
2) ශිෂ්‍යයින් විසින් විභාග කාලසටහන සම්බන්ධයෙන් නීති පීඨයේ විභාග සම්බන්ධීකාරක සිදු කරනු ලබන අවශ්‍ය දැන්වීම් හා විභාග නිවේදන ලබා ගැනීම සඳහා ඉගෙනුම් කළමනාකරණ පද්ධතිය (LMS) සහ විද්‍යුත් තැපැල නිතිපතා පරීක්ෂා කළ යුතුය;
3) විභාගය අතරතුර කිසිදු බාධාවක් ඇතිවීම වළක්වා ගැනීම සඳහා ස්ථාවර අන්තර්ජාල සම්බන්ධතාවයක් සහ සුදුසු ස්ථානයක් සහ සුදුසු පරිගණකයක්/උපාංගයක් පවත්නා බවට සනාථ කිරීම ශිෂ්‍යයාගේ වගකීම වේ;
4) කිසියම් සිසුවෙකුට විභාගය සඳහා සුදුසු උපකරණයක් නොමැති නම්, ඇය/ඔහු විසින් විශ්වවිද්‍යාල පරිශ්‍රය තුළ පහසුකම් ලබා දෙන ලෙස නීති පීඨයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී (SAR/Faculty of Law) වෙත ඉල්ලීමක් ඉදිරිපත් කළ යුතුය. එවැනි අවස්ථාවකදී, සියලුම සෞඛ්‍ය ආරක්ෂණ රෙගුලාසිවලට අනුකූලව විභාගය පැවැත්වීම සඳහා අදාළ ශිෂ්‍යයා විශ්ව විද්‍යාලයට පැමිණිය යුතුය. මෙම සැලැස්ම නීති පීඨයේ සහ විශ්ව විද්‍යාල බලධාරීන්ගේ අභිමතයට යටත් ය;
5) ශිෂ්‍යයා විසින් ලිවීමට උත්සාහ කළ සියලුම ප්‍රශ්න සඳහා පිළිතුරු නියමිත වේලාවට ඉදිරිපත් කිරීම සහතික කළ යුතු අතර උපදෙස් අනුව නිසි පරිදි උඩුගත කළ යුතුය.
6) විසන්ධිවීමේ තාක්ෂණික ගැටළුවක් පවතී නම්, ශිෂ්‍යයා විසින් විසන්ධි කිරීම/සම්බන්ධතා ගැටළු පෙන්වන තිර පිටපතක් (screen shot) ලබාගෙන, එය විභාගය ආරම්භ වීමට පෙර වහාම අදාළ විභාග ශාලාධිපති වෙත (WhatsApp/විද්‍යුත් තැපැල/ඉගෙනුම් කළමනාකරණ පද්ධතිය (LMS) හරහා) ලැබීමට සැලැස්විය යුතුය.
7) විභාගය අතරතුර කිසියම් විෂමාචාරයක් සිදුවුවහොත්, නීති පීඨයට සහ විශ්ව විද්‍යාලයට ශිෂ්‍යයා බැහැර කර අදාළ සිදුවීම විශ්ව විද්‍යාලයේ විභාග කමිටුව වෙත වාර්තා කළ හැකිය.
8) විද්‍යුත් තැපැල/ඉගෙනුම් කළමනාකරණ පද්ධතිය (LMS)/කෙටි පණිවුඩ/WhatsApp හරහා විභාග ශාලාධිපති වෙත ඕනෑම ගැටළුවක් පිළිබඳ විමසීම් සිසුන්ට ඉදිරිපත් කළ හැකිය. විභාග ශාලාධිපති විසින් ඇයට/ඔහුට අවශ්‍ය පැහැදිලි කිරීම හෝ විස්තර කිරීම සිදු කරනු ලැබේ.

| | |
|---|---|
| **ශිෂ්‍ය/ශිෂ්‍යාවගේ අත්සන** | |
| **දිනය** | |

# කොළඹ විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකාව
# නීති පීඨය
# නීතිවේදී උපාධිය පරීක්ෂණය - මාර්ගගත, 2020/2021

## විභාගයෙන් පසු විශේෂ ප්‍රකාශය

| | | | | | |
|---|---|---|---|---|---|
| **1** | **ශිෂ්‍ය/ශිෂ්‍යාවගේ නම:** | | | | |
| **2** | **ලියාපදිංචි අංකය:** | | | | |
| **3** | **අධ්‍යයන වසර:** | I වසර | II වසර | III වසර | Iv වසර |
| **වි ෂ ය** | **1)** | | | | |
| | **2)** | | | | |
| | **3)** | | | | |
| | **4)** | | | | |
| | **5)** | | | | |
| | **6)** | | | | |

මෙම විභාගය මා විසින් ලියන ලද්දක් බව මම මෙයින් ප්‍රකාශ කරමි. එය මගේම කාර්යයෙහි ප්‍රතිඵලයකි - ශ්‍රී ලංකාවේ හෝ වෙනත් රටක වෙනත් ආයතනයක වෙනත් විභාගයක් සඳහා භාවිතා කර නොමැත - අන්තර්ගතයෙහි සහ විමර්ශන ලැයිස්තුවේ සඳහන් කිරීමෙන් තොරව අනෙක් අයගේ කෘති/උපුටා දැක්වීම් සිදු කර නොමැත - මාගේ පෙර ලියන ලද රචනා අන්තර්ගතයෙහි සඳහන් නොකර/උපුටා දක්වා නොමැත.

පාඨමාලාවේ විශේෂ අනුනීති ප්‍රතිපාදනයන් යටතේ මෙම විභාගය පවත්වනු ලබන බවත් අඛණ්ඩ අධ්‍යයනයන් කෙරෙහි යහපත් චේතනාවෙන් යුතුව මෙම අවස්ථාව ලබා දී ඇති බව මම මැනවින් දනිමි. යම් පිළිගත නොහැකි පරිචයන්, සාමාන්‍ය රීති සහ මාර්ගෝපදේශ උල්ලංඝණය කිරීම් වංචා කිරීමක් ලෙස සලකනු ලබන අතර විභාගය හෝ ප්‍රශ්න පත්‍රය අවලංගු කිරීමට හේතු විය හැක. වංචා කිරීම හෝ වංචා කිරීමට ප්‍රයත්න දැරීම විශ්ව විද්‍යාල නීති රීතිවලට අනුකූලව විභාග අපේක්ෂයා නෙරපා හැරීමට හේතු විය හැකිය.

| | |
|---|---|
| **ශිෂ්‍ය/ශිෂ්‍යාවගේ අත්සන** | |
| දිනය | |